**ශ්‍රේෂ්ඨතම සැමරුම තපස්යාවයි. තපස්යාව යනු පරම පියා සමග සතුට අත්විඳීමයි.**

අද දින, නව ඥානය තුළින් නව දිවියක්, නව ආකල්පයක්, නව දැක්මක් සහ නව ලෝකයක් අත්විඳින, සෑම තැනකම සිටින දරුවන්ට බාප්දාදා සෙනෙහසේ සුබ පැතුම් ලබා දෙනවා. වත්මන් මොහොතේ සෑම තැනකම සිටින දරුවන් ඔවුන්ගේ හදවත් රූපවාහිනියේ වත්මන් දිව්‍යමය ජවනිකාව නරඹමින් සිටිනවා. සියලු දෙනාටම තිබෙන්නේ එක සිතිවිල්ලකි දුර සිටින අතර සමීප බව අත්විඳීමට. බාප්දාදාටද සියලුම දරුවන්ව පෙනෙනවා. දරුවන්ගේ හදවත් වලින් ඔවුන්ගේ නව උනන්දුව සහ උද්යෝගයේ සුබ පැතුම් වල සංගීතය බාප්දාදාට ඇසෙනවා. සියලු දෙනාගේ සෙනෙහසින් පිරි විවිධාකාර සංගීතයේ හඬ වන්නේ, සෑම මොහොතක්ම ප්‍රීතිමත් මොහොතක් බවයි. තිබෙන්නේ සතුටයි, වෙන කිසිවක් නොව සතුටම පමණයි, එය සුන්දර නොවන්නේද? මේ නිසයි බාප්දාදා පෙරළා මෙසේ ප්‍රතිචාර දක්වන්නේ සෑම කලටම සුබ පැතුම්, නව වසරට, නව උනන්දුව සහ උද්යෝගයට සහ සෑම විටම තමන් තුළ දිව්‍යත්වය ගෙන ඒම වෙනුවෙන්. නව වසර වෙනුවෙන් අද පමණක් සුබ පැතුම් ලබා දෙනවා නොවෙයි, නමුත් සදාතනික පියාට සදාතනික සෙනෙහසේ වගකීම ඉටුකරන දරුවන්ගේ ජීවිත වල, සංගම යුගයේ සෑම මොහොතකම නවතාවයක් තිබෙයි. මේ නිසයි ඔබට අවිනාශි පියාගෙන් සෑම මොහොතකම අවිනාශී සුබ පැතුම් ලැබෙන්නේ. ඔය සියලුම බ්‍රහ්මිණ්වරු ඉදිරියට ගමන් කරන්නේ බාප්දාදාගේ සතුටේ විශේෂ සුබ පැතුම් නිසයි. බ්‍රහ්මිණ් දිවියේ පෝෂණයේ පදනම වන්නේ සුබ පැතුම්ය. සුබ පැතුම් වල සතුටින් ඔබ අඛණ්ඩව ඉදිරියට ගමන් කරයි. පියාගේ ස්වරූපයෙන් ඔබට සෑම විටම සුබ පැතුම් ලැබෙයි. ගුරුවරයාගේ ස්වරූපයෙන 'බොහොම හොඳයි, බොහොම හොඳයි!' යන වචන, ඔබව සම්මාන ඇතිව සමත් කරවයි. සෑම ශ්‍රේෂ්ඨ ක්‍රියාවක් වෙනුවෙන්ම සත්ගුරුගේ ස්වරූපයෙන් ලැබෙන ආශිර්වාද, ඔබට ජීවිතය පහසු සහ විනෝදජනක බව අත්විඳීමට සලස්වයි. ඔබ කෝටි ගුණයක් වාසනාවන්ත වන්නේ මේ නිසයි. ඔබ භාග්‍යය පිරිනමන්නා වන පරමාත්ම දෙවියන්ගේ දරුවන් වී ඇත, එනම්, ඔබ සම්පූර්ණ භාග්‍යයට අයිතියක් හිමි කරගෙන තිබේ. මිනිසුන් විශේෂ දිනවල විශේෂ සුබ පැතුම් ලබා දෙයි. ඔබට සුබ පැතුම් ලැබෙන්නේ අළුත් අවුරුද්දට පමණක්ද? 1 වෙනිදාට පසුව එය 2 වන දා වූ විට සුබ පැතුම් නවතිනවාද? ඔබට, සෑම මොහොතක්ම සෑම විටම විශේෂයි. සංගම යුගය විශේෂ යුගයයි, සුබ පැතුම් වල යුගයයි. දිනපතාම අම්රිත් වේලාවේ ඔබට පියාගෙන් සුබ පැතුම් ලැබෙනවා නේද? මේ දවස අළුත් අවුරුද්ද කියා නමට සමරයි, නමුත් සෑම විටම මතකයේ තබා ගන්න, ඔබගේ ජීවිතයේ තිබෙන්නේ කුමක්ද කියා ඔබෙන් යමෙක් විමසන්නේ නම්, ඔබ පිළිතුරු දෙන්නේ කෙසේද? තිබෙන්නේ ප්‍රීතියයි, ප්‍රීතියම හැර වෙන දෙයක් නොවේ. පරම පියාව මුණ ගැසීමේ සතුටේ අත්දැකීම, ඔබට රාජධානියට අයිතියක් තිබීමේ අත්දැකීම සහ මුළු චක්‍රයටම වන්දනීයත්වයට පත් වීමේ අයිතිය ඔබට ලබා දෙන නිසා, මුළු චක්‍රයේම සතුට ඔබ මේ ජීවිතයේ අත්විඳියි. ඒ දෙකේම දැනුම ඔබට තිබෙන්නේ මෙකලයි වන්දනීය වීමේ සහ පාලනය කිරීමේ. ඔබ දැන් සතුට අත්විඳින්නේ මේ නිසයි.

ඔබ මේ වසරේ කරන්නේ කුමක්ද? ඔබ නවතාවයක් ගෙන එනවා නේද? මේ වසර උත්සවශ්‍රීයේ වසරක් ලෙස සැමරිය යුතුයි. ඔබ මෙසේ සිතනවාද අප තපස්යාවේ සිටීමට යනවාද, නැත්නම් සමරනවද? සියල්ලටම වඩා උසස් සැමරුම තපස්යාවයි, මන්ද, ඔබ කොහොමත් හත යෝගාව සිදු කරන්නේ නැහැ. තපස්යාව යනු පියා සමග සතුට අත්විඳීමයි හමුවීමේ සතුට, සියලු ලැබීම් අත්කර ගැනීමේ සතුට, සමීප බව අත්විඳීමේ සතුට සහ සමාන වීමේ ස්ථිතියේ සතුට. එබැවින්, මෙය සැමරුමක් නොවේද? සේවය වෙනුවෙන් ඔබ විශාල සැමරුම් ඇති නොකරයි, නමුත් තපස්යාවේ වාතාවරණය, වචන වලින් පවත්වන ඕනෑම සැමරුමකට වඩා ජීවාත්මයන්ව ඇදගෙන ඔවුන්ව බාබා වෙතට ආකර්ෂණය කරයි. තපස්යාව කෙතරම් ආධ්‍යාත්මික කාන්දමක්ද යත්, එය ජීවාත්මයන්ට දුර සිට සාමය සහ බලය අත්විඳීමට මඟපාදයි. ඔබ තමන් තුළ ඇති කරන්නේ කුමන නවතාවයක්ද? සියලු දෙනා ප්‍රිය කරන්නේ නවතාවයටයි. එබැවින් සෑම විටම තමන්ව පරීක්ෂා කරන්න අද, මගේ මනසේ එනම්, මගේ සිතිවිලි බලයේ මා කුමන විශේෂ විශේෂත්වයද ගෙන ආවේ? එමෙන්ම මගේ මනසින් සිදු කරන සේවයේ එනම්, අන් ජීවාත්ම කෙරෙහි සුබ පැතුම් සහ පිවිතුරු හැඟීම් ඇති කිරීමේ ක්‍රම වේදය කෙතරම් ප්‍රමාණයකින් වැඩි වුණාද? මින් අදහස් වන්නේ ඔබගේ ශ්‍රේෂ්ඨ ස්ථිතියට ඔබ ගෙන ආවේ කුමන නවතාවයක්ද? එය සමගම, මගේ වචන වල මිහිරියාවේ, තෘප්තියේ සහ සරල බවේ

නවතාවය මා කෙතරම් ප්‍රමාණයකින් ගෙන ආවද? බ්‍රහ්මිණ් ජීවාත්මයන්ගේ වචන සාමාන්‍ය වචන නොවේ. තමන් වෙනුවෙන් සහ වෙනත් ජීවාත්ම වෙනුවෙන් ඔබගේ වචන වල ඔබ මේ කාරණා තුන අත්දැකිය යුතුයි. මෙය නවතාවය ලෙස හැඳින්වෙයි. මෙයත් සමගම, සෑම ක්‍රියාවකම නවතාවය යනු, සෑම ක්‍රියාවක් තුළින්ම තමන් සහ අන් ජීවාත්ම ලැබීම් අත්විඳිය යුතුයි. ඔබ කෂණික ඵලය මෙන්ම කර්මයේ අනාගත ඵලයේ රැස් කිරීමද අත්දැකිය යුතුයි. වත්මන් කාලයේ කෂණික ඵලය ලෙස ඔබ සතුට සහ බලයේ තෘප්තිය සහ අනාගතයට එක්රැස් කිරීම අත්විඳිය යුතුයි. එවිට තමන් නිරන්තරයෙන් පරිපූර්ණ සහ පරිසමාප්ත බව අත්විඳිනු ඇත. කර්මයේ බීජය, ලැබීම්වල ගසින් පුරවන්න එය හිස් නොවිය යුතුයි. පිරිපුන් ජීවාත්මයකට ස්වභාවිකවම ආධ්‍යාත්මික කුල්මත් බව තිබේ. ඔබ එවන් නවතාවයේ ක්‍රියා සිදුකර තිබෙනවාද? එය සමගින්ම ඔබගේ නෑ සබඳතාවන්හි ඔබ ගෙන ආ යුත්තේ කුමන නවතාවයද?

මේ වසරේ ඔබ දානපතිගේ දරුවන්, මාස්ටර් දානපතියන්, වීමේ අවධානය අත්විඳිය යුතුයි. ඔබ නෑ සබැඳියාවක් ඇති කරගන්නේ බ්‍රහ්මිණ් ජීවාත්මයක් සමග හෝ සාමාන්‍ය ජීවාත්මයක් සමග වුවද, එම ජීවාත්මය මාස්ටර් දානපතියෙකුගෙන් ලැබීම් අත්විඳිය යුතුයි. ඔවුන්ට එඩිතරම ලැබිය හැක, ඔවුන්ට උනන්දුව සහ උද්යෝගය ලැබිය හැක, ඔවුන්ට සාමය හෝ බලය ලැබිය හැක, ඔවුන්ට පහසුවෙන් ප්‍රගතිය හෝ සතුට ලබාගත හැක ඔවුන්ගේ අත්දැකීම් වලින් ඔවුන් වර්ධනය වන අන්දම අත්විඳින්නට, පහසු මාර්ගයක් සොයා ගත්තාවේ. සෑම කෙනෙකුටම ඔබ එක හෝ තව දෙයක් ලබා දිය යුතුයි. ඔබ ලබා නොගත යුතුයි, නමුත් ලබා දිය යුතුයි. දීම තුළ ලැබීම මුසු වී තිබේ. කෙසේවෙතත්, 'මා වන ජීවාත්මය, මාස්ටර් දානපතියෙක් විය යුතුයි.' මේ අන්දමින් ඔබගේ ස්වභාවය සහ සංස්කාර වලින් පියාට සමාන වීමේ නවතාවය ඔබ ගෙන ආ යුතුයි. 'මගේ ස්වභාවය' යන අවධානය නොතිබිය යුතුයි. පියාගේ ස්වභාවය කුමක් වුවත් එය 'මගේ ස්වභාවයයි.' බ්‍රහ්මගේ සංස්කාර බ්‍රහ්මිණ්වරුන්ගේ සංස්කාරයි. මේ ආකාරයෙන් දිනපතාම තමා තුළ නවතාවය ගෙන එන්න, එවිට නව ලෝකය ඉබේටම ස්ථාපිත වෙයි. එබැවින් නව වසරේ ඔබ කළ යුත්තේ කුමක්ද කියා ඔබට වැටහෙනවාද? පසුගිය වසරේ සිදු වූ දේවල සමාප්ත උත්සවය සමරන්න එමෙන්ම බාබාට සමාන වීම සහ සමීප බව වර්තමානයේ සමරන්න. එමෙන්ම ඔබගේ අනාගත නිරන්තර සාර්ථකත්වය සමරන්න. උත්සවශ්‍රීයේ වසර සමරා පියාසර කරමින් සිටින්න.

ඔය ද්විත්ව විදේශිකයන් සතුටින් සිටීමට ප්‍රිය කරනවා නේද? සතුටින් සිටීම සඳහා වචන දෙකක් මතකයේ තබාගන්න. පළමුව තිත සහ දෙවනුව නැත. ඔබ 'නැත' කිව යුත්තේ කුමකටද කියා ඔබ දන්නවා මායාට අවසර නැත. 'නැත' කියන්නේ කෙසේද කියා ඔබ දන්නවාද? නැත්නම් ඔබ ඇයට ටිකක් ඉඩ දෙනවාද? තිතක් තබන්න එවිට එය නැත වෙයි. ඔබට දෙගුණයක කුල්මත් බවක් තිබෙනවා නේද?

භාරත වැසියන් කරන්නේ කුමක්ද? ශ්‍රේෂ්ඨ දේශය භාරතයයි. මේ දිනවල පාඨය මෙයයි. භාරතයේ ශ්‍රේෂ්ඨ ජීව මහාත්මයන් ලෙස සිහි කෙරෙයි. ඉතිං, භාරතය ශ්‍රේෂ්ඨ නිසා භාරත ජනතාව ශ්‍රේෂ්ඨ ජීවාත්මයි. ඔබගේ සෑම කල්හි ශ්‍රේෂ්ඨත්වය නිසා, ඔබ භාරතය ශ්‍රේෂ්ඨ ජීවාත්මයන්ගේ තැනක් බවට පත් කරයි, ශාරීරික ස්වරූපයේ දේවතා ජීවාත්මයන්ගේ ස්ථානයක්. පිංතූර අවසන් වී, ජීවමාන දේවතා ජීවාත්මයන්ගේ ස්ථානය, සියලු දෙනාට හෙළිදරව් වෙයි, එහෙම නේද? ඉතිං ඔබ ද්විත්ව විදේශිකයන් සහ භාරත වැසියන් නොව නමුත් දැන් දෙපිරිසම මධුබාන් නිවැසියන්ය. අච්චා.

මාස්ටර් දානපතියන් වන සෑම තැනකම සිටින සියලුම ජීවාත්මයන්ට, පරම පියාගෙන් නිරන්තරයෙන් සුබ පැතුම් ලබා ගන්නා විශේෂ ජීවාත්මයන්ට, නිරන්තරයෙන් සතුටින් සිටින භාග්‍යවන්ත ජීවාත්මයන්ට, තමන් තුළ නිරතුරුවම නවතාවය ගෙන එන ශ්‍රේෂ්ඨ ජීවාත්මයන්ට, සුරදූතයන් සහ එබැවින් දේවතා ජීවාත්ම වීමට යන වඩාත්ම ශ්‍රේෂ්ඨ ජීවාත්මයන්ට, සෑම මොහොතකම බාප්දාදාගේ සෙනෙහස, සිහි කිරීම සහ නමස්කාරය.

**බාප්දාදා කණ්ඩායම් මුණගැසෙමින්**

1) තමන් අචල සහ නොසැලෙන ජීවාත්ම බව ඔබ අත්විඳිනවාද? එක් පැත්තකින් කැලඹීම් තිබෙන අතර අනෙක් පැත්තේ නිරන්තරයෙන් නොසැලී සිටින ඔය බ්‍රහ්මිණ් ජීවාත්ම සිටියි. කැලඹීම් වැඩි වන තරමට ඔබගේ නොසැලෙන අචල ස්ථිතිය ඇතුලාන්තයෙන් වැඩි වන බව ඔබ අත්විඳියි. කුමක් සිදු වුණත් කමක් නැහැ, භාවිත කිරීමට ඇති පහසුම ක්‍රමවේදය වන්නේ 'අලුත් දෙයක් නොවෙයි!' කිසිම දෙයක් අළුත් නැත. ඔබ කිසිම විටෙක පුදුම වෙනවාද සිදු වන්නේ කුමක්ද? හෝ කුමක් සිදු වෙයිද? යම් අළුත් දෙයක් සිදුවන විට

පුදුමයක් ඇති වෙයි. ඔබ යමක් ගැන සිතා නැත්නම්, ඔබ එය අසා නැත්නම්, ඔබ එය වටහාගෙන නැති අතර එය හදිසියේ සිදු වන විට ඔබ පුදුම වෙයි. එබැවින් කිසිදු විශ්මයාර්ථයක් නොතිබිය යුතුයි, තිබිය යුත්තේ නැවතීමේ තිතකි. ලෝකය අවුලක (මුන්ජ්) තිබේ, නමුත් ඔබ ප්‍රීතියෙන් (මෞජ්) සිටින අයයි. සුළු දේවල් වලට ලෝකය සිතන්නේ 'අප කුමක් කරන්නද? අප මෙය කරන්නේ කෙසේද?' නමුත් ඔබ සැම විටම සතුටින් සිටින අතර ඔබගේ ව්‍යාකූලත්වය අවසන් වී ඇත. බ්‍රහ්මිණ්වරු යනු සතුට වන අතර කෂත්‍රියයන් යනු ව්‍යාකූලත්වයයි විටෙක සතුට තිබෙන අතර විටෙක ව්‍යාකූලත්වය තිබේ. ඔබ සියලු දෙනාම පවසන්නේ ඔබගේ නම බ්‍රහ්ම කුමර කුමරියන් බවයි. ඔබ කෂත්‍රිය කුමර කුමරියන් නොවෙයි නේද? ඔබ නිරන්තරයෙන් ඔබගේ වාසනාව ගැන සතුටින් සිටියි. නිරන්තරයෙන් සහ ඉබේටම ඔබගේ හදවත් වල මෙම ගීතය වාදනය වෙමින් තිබේ අපූරුයි බාබා! සහ අපූරුයි මගේ වාසනාව! මෙම ගීතය ඉබේටම වාදනය වෙයි. එය වාදනය කිරීමට ඔබට අවශ්‍ය වන්නේ නැහැ එය සදාකාලිකව වාදනය වෙයි. අසහනයේ සියලු හැඬීම් අවසන් වී ඇති අතර ඔබ දැන් පවසන්නේ, 'අපූරුයි! අපූරුයි!' වැඩි දෙනෙක් අසහනයෙන් හඬ නගන නමුත් 'අපූරුයි! අපූරුයි!' කියන්නේ ටික දෙනෙකි. එසේ නම් ඔබ නව වසරේ සිහි කරන්නේ කුමක්ද? අපූරුයි! අපූරුයි! ඔබ ඉදිරියේ ඔබ කුමක් දුටුවත්, ඔබට කුමක් ඇසුනත්, ඔබ කුමක් පැවසුවත් සැම දෙයක්ම 'අපූරුයි! අපූරුයි!' 'හායි, හායි' (අසහනයේ හැඬීම්) නොවෙයි. 'අනේ! දැන් කුමක්ද සිදුව තිබෙන්නේ?' නොවෙයි, නමුත් ඒ වෙනුවට, 'අපූරුයි! කුමක් සිදු වුණත් එය ඉතා හොඳයි.' කෙනෙක් යම් නරක දෙයක් සිදු කළත් ඔබගේ බලයෙන් නරක, හොඳ බවට පරිවර්ථනය කරන්න. මෙය පරිවර්ථනයයි, එහෙම නේද? ඔබගේ බ්‍රහ්මිණ් දිවියේ නරක කිසිවක් තිබිය නොහැක. කෙනෙක් ඔබට අපහාස කළත්, ඔබට දරාගැනීමේ පාඩම ඉගැන්වීම නිසා, එය, ඔබට අපහාස කරන පුද්ගලයාගේ ශ්‍රේෂ්ඨත්වයයි. ඔබගේ අධිපතියා බවට පත්වීම, ඔහුගේ ශ්‍රේෂ්ඨත්වයයි! අඩු තරමින් ඔබට කෙතරම් දරා ගැනීමේ බලය තිබෙනවාද කියා ඔබ දැනගත්තා එසේ නම් එය හොඳද, නරකද? බ්‍රහ්මිණ්වරුන්ගේ දැක්ම තුළ කිසිම නරක දෙයක් තිබිය නොහැක. බ්‍රහ්මිණ්වරුන්ගේ දෙසවනින් කිසිම නරක දෙයක් ඇසිය නොහැක. බ්‍රහ්මිණ් දිවිය ප්‍රීතිමත් දිවියක් වන්නේ මේ නිසයි. එක මොහොතකදී යම් නරක දෙයක් සහ ඊළඟ මොහොතේ යම් හොඳ දෙයක් වන්නේ නම්, එවිට සතුට තිබිය නොහැක. ඔබට නිරන්තරයෙන් තිබෙන්නේ සතුටයි, සතුටම පමණයි. මුළු කල්පයෙන්ම ශ්‍රේෂ්ඨ වන්නේ බ්‍රහ්ම කුමර කුමරියන්ය. බ්‍රහ්මිණ්වරු සමග සසඳන විට දේවතා ජීව පවා නොවටින්නේය. මෙම කුල්මත් බව සැම විටම පවත්වා ගන්න. නිරන්තරයෙන් සතුටින් සිට අන් අයවත් නිරන්තරයෙන් සතුටින් තබන්න. සතුටින් රැඳී සිටිමින් අන් අයවත් සතුටින් තබන්න. 'මා කොහොමත් සිටින්නේ සතුටින්' කියා නොකියන්න. නැහැ. එය මෙසේද විය යුතුයි මා අනෙක් සියලු දෙනාවත් සතුටින් තබනවා. 'මා කොහොමත් සිටින්නේ සතුටින්' යනු ආත්මාර්ථකාමී වීමය. බ්‍රහ්මිණ්වරුන්ගේ සේවය කුමක්ද? ඔබ සතුට වෙනුවෙන් දැනුම ලබා දෙයි.

2. ලෝකයේ ශ්‍රේෂ්ඨ ජීවාත්මයන්ව කෙතරම් සිහි කළත්, ඔබ ඔවුන්ට වඩා බොහෝ සේ ශ්‍රේෂ්ඨයි. දැන් පරම පියා අයත් වන්නේ ඔබටයි. එබැවින් ඔබ බොහෝ ශ්‍රේෂ්ඨ වී ඇත! වඩාත්ම ශ්‍රේෂ්ඨ වී ඇත්තේ ඔබයි. උසස්ම-උසස් පියා වඩාත්ම ශ්‍රේෂ්ඨ ජීවාත්ම බවට ඔබව පත් කර ඇති බව, සැම විටම ඔබගේ අවධානයේ තබාගන්න. ඔබගේ දෘෂ්ඨිය බොහෝ ශ්‍රේෂ්ඨ වී ඇත, ඔබගේ ආකල්පය බොහෝ ශ්‍රේෂ්ඨ වී ඇත. සියල්ල වෙනස් වී ඇත. දැන් ඔබ යමෙක් දෙස බලන්නේ නම්, ඔබ ඔවුන් දෙස බලන්නේ ජීව අවධාන දැක්මෙන් වන අතර සැම කෙනෙක් වෙනුවෙන්ම ඔබගේ ආකල්පය හිතකාමී වී ඇත. බ්‍රහ්මිණ් දිවිය යනු සැම ජීවාත්මයක් වෙනුවෙන්ම ඔබගේ දැක්ම සහ ආකල්පය ශ්‍රේෂ්ඨ වී ඇති බවයි.

3) ඔබ සාර්ථකත්වයේ තාරකා බව ඔබ අත් විඳිනවාද? සියලු බල ඇති තැන, සාර්ථකත්වය ඔබගේ ජන්ම උරුමයයි. ඔබ කුමන කාර්යයක් සිදු කළත්, එය ඔබගේ සිරුරේ ජීවිකාව වෙනුවෙන් හෝ දේවමය සේවය වෙනුවෙන් වුනත්, එම කාර්යය සිදු කිරීමට පෙර, මෙම විශ්වාසය තබා ගන්න. මෙම විශ්වාසය තිබීම හොඳයි, නමුත් මෙම ප්‍රායෝගික අත්දැකීම ඇති ජීවයක් වී ඔබගේ විශ්වාසය සහ කුල්මත් බව පවත්වාගන්න. මෙම බ්‍රහ්මිණ් දිවියේ සාර්ථකත්වය ඇති වීමේ පහසු මඟ වන්නේ සියලු බලයන්ය. ඔබ සියලු බලයන්ගේ අධිපතියන්ය. එබැවින් ඕනෑම විටෙක ඔබ නියෝග කරන කුමන බලයක් වුවත් ඔබ ඉදිරියේ පෙනී සිටියි. ඔබ ඔවුන්ට නියෝග කරන ඕනෑම විටෙක ඇතැම් සේවාධාරීන් සේවයට සූදානම් වෙයි. ඒ අන්දමින්ම, සියලු බල ඔබගේ අණසක යටතේ තබා ගන්න. මාස්ටර් සර්ව බලධාරියෙකුගේ අසුනේ ඔබ වඩාත් ස්ථිරව අසුන් ගන්නා තරමට, සියලු බල වඩාත් ඔබගේ නියෝග යටතේ තිබෙයි. ඔබ මෙම අවධානයේ අස්නෙන් සුළු වශයෙන් හෝ ඉවතට යන විට බලයන් ඔබගේ අණ නොපිළිපදිනු ඇත. දාසියන් වුණත් සමහරු කීකරු වන අතර සමහරු ඔබට ටිකක් කරදර ඇති කරයි. එබැවින් ඔබගේ සියලු බල ඔබ ඉදිරියේ හැසිරෙන්නේ කෙසේද? ඒවා

කීකරුද, නැත්නම් ඒවා පැමිණෙන්නේ ටිකක් පමා වෙලාද? ඔබ ඒවාට යමක් කිරීමට පවසන විට ඔබගේ භෞතික ඉන්ද්‍රියන් ඔබගේ අණසකට යටත්ව ක්‍රියා කරන සේම, මෙම සූක්ෂම බලද ඔබගේ අණසක යටතේ ක්‍රියාත්මක විය යුතුයි. පරීක්ෂා කරන්න දවස පුරා මෙම සියලු බල තිබුණේ මගේ අණසක යටතේද? මන්ද මෙම බල දැන් සිටම ඔබගේ අණසක යටතේ තිබුණොත් පමණයි ඔබට අවසානයේ සාර්ථකත්වය අත්කර ගැනීමට හැකි වන්නේ. මේ සඳහා දිගු කාලයක් පුරා කරන මෙම පුහුණුව අවශ්‍යයි. එබැවින් මේ නව වසරේ සියලු දේවල් ඔබගේ නියෝග යටතේ ක්‍රියාත්මක කරවීමේ විශේෂ පුහුණුව ඇති කරගන්න, මන්ද, ඔබට ලෝක රාජධානිය අත්කර ගැනීමට අවශ්‍යයි නේද? ලෝක අධිරාජයෙක් වීමට පෙර ස්ව-අධිරාජයෙක් වන්න.

ශ්‍රද්ධා විශ්වාසය සහ කුල්මත් බව සෑම දරුවෙකුටම පියාසර ස්ථිතියේ අත්දැකීම ගෙන දෙනවා. ඔබ පියාසර ස්ථිතිය කාලයේ පැමිණ ඇති නිසා ඔය ද්විත්ව විදේශිකයන් වාසනාවන්තයි. ඔබට ඉහළ නැඟීමට වෙහෙස වීමට සිදු වුයේ නැහැ. ඔබගේ නළල් මත ජයග්‍රහණයේ තිලක නිරන්තරයෙන් බැබලෙනවා. මෙම ජයග්‍රහණයේ තිලක අන් අයට සතුට ලබා ගැනීමට මඟ පාදයි, මන්ද ජයග්‍රාහී ජීවාත්මයකගේ මුහුණ සෑම විටම ප්‍රබෝදමත්ය. ඔබගේ ප්‍රබෝදමත් මුහුණු දැක, සියලු දෙනාම එම සතුටට ආකර්ෂණය වෙයි, මන්ද, ලෝකයේ ජීවාත්ම සතුට සොයමින් සිටියි. එබැවින් ඔබගේ මුහුණු මත සතුටේ දිස්නය ඔවුන් දකින විට ඔවුන්ද සතුටට පත් වෙයි. ඔබ යම් ලැබීමක් අත්විඳ ඇති බව ඔවුන්ට අවබෝධ වෙයි. ඔබ තව ප්‍රගතිය ලබන විට සතුටේ ආකර්ෂණය ඇති ඔබගේ මුහුණු ජීවාත්මයන්ව සමීපයට ගෙන එයි. කිසිවෙකුට කිසි දේකට සවන් දීමට කාලය නොතිබෙයි, එබැවින් ඔබගේ මුහුණු තත්පරයකදි ඒ ජීවාත්මයන්ට සේවය කරයි. ඔබ සියලු දෙනාමත් එම සෙනෙහස සහ සතුට දුටු විට බ්‍රහ්මිණ්වරු වුණා නේද? එබැවින් මෙම තපස්යාවේ වර්ෂයේ ඔබ මේ අන්දමේ සේවයක් සිදු කළ යුතුයි.

4) ඔබ වෙනත් කිසිවෙකුට නොව, ඒකායන පියාට පමණක් අයත් ස්ථිතියේ ස්ථාවරව රඳී සිටින සහයෝගී ජීවාත්මද? එක්කෙනෙක්ව පමණක් සිහි කිරීම පහසු වන අතර බොහෝ දෙනෙක් සිහි කිරීම අපහසුයි. බොහෝ දේවල විස්තාරණය අතහැර, සාරයේ ස්වරූපය වන ඒකායන පියාට අයත් වීමේ අත්දැකීමේ සිටීමේ බොහෝ සතුට තිබේ. සතුට ඔබගේ ජන්ම උරුමයයි එය පියාගේ සම්පතයි, එබැවින් පියාගේ සම්පත දරුවන්ගේ ජන්ම උරුමයයි. සම්පතක් ඔබට අයත් වන විට, එය ඔබගේ වීම ගැන ඔබ ආඩම්බර වනවා. ඉතිං ඔබට ඒවා ලැබුණේ කාගෙන්ද? අවිනාශි පියාගෙන්. එබැවින් අවිනාශී පියා ලබා දෙන ඕනෑම දෙයක් අවිනාශී වනු ඇත. අවිනාශි සම්පත් වල කුල්මත් බව අවිනාශීය. කිසිවෙකුට මෙම කුල්මත් බව ඔබගෙන් ඉවත් කිරීමට නොහැකි අතර එය හානියක් ගෙන දෙන කුල්මත් බවක් නොවෙයි. ඔබට ලැබීම් ගෙන දෙන්නේ කුල්මත් බවයි. අනෙක් කුල්මත් බව ඔබට ඔබගේ ලැබීම් අහිමි කරවයි. එසේ නම් ඔබ නිරන්තරයෙන් සිහි කරන්නේ කාවද? ඒකායන පියා හැර වෙනත් කිසිවෙක් නොවේ. දෙවන හෝ තුන්වන පුද්ගලයෙක් සිටියි නම් ගැටුමක් ඇති වන අතර ඒකායන පියා පමණක් සිටින විට ඔබට ස්ථාවර ස්ථිතියක් තිබෙයි. ජීවාත්මයන්ගේ ආදිතම ස්වරූපය වන්නේ ස්ථාවරව සිටීම නිසා ඒකායන කෙනාගේ සෙනෙහසේ ගිලී සිටීම ඉතා හොඳ හැඟීමක් ගෙන දෙයි.

**සමුගන්නා වෙලාවේ නව වසරේ ශුභ ආරම්භය වෙනුවෙන් සුබ පැතුම්.**

සෑම තැනකම සිටින සියලුම ආදරණීය සහ වාසනාවන්ත දරුවන්ට විශේෂ නව උනන්දුව සහ උද්යෝගයේ සෑම මොහොතක් වෙනුවෙන් සුබ පැතුම්. ඔබ දියමන්ති වන අතර ඔබගේ ජීවිතත් දියමන්තිය, එබැවින් එය සෑම විටම දියමන්ති උදෑසනක්, දියමන්ති සවසක් සහ දියමන්ති රාත්‍රියක් කරගන්න. මෙම ක්‍රමවේදයෙන් ඔබ ඉතා විගසින් ඔබගේම රාජධානිය ස්ථාපිත කර ඉන්පසුව එහි පාලනය කරයි. ඔබගේම රාජධානියට ඔබ ඇලුම් කරයි, එහෙම නේද? එබැවින් දැන් එය විගසින් ගෙනැවිත් ඉන්පසුව එහි පාලනය කරන්න. ඔබ ඉදිරියේ ඔබගේම රාජධානිය ඔබට දැක ගත හැක, එහෙම නේද? ඉතිං දැන් සුරදූතයන් සහ එබැවින් දේවතාවන් වන්න. සෑම තැනකම සිටින සියලුම දරුවන්ට, විශේෂයෙන් කෝටි ගුණයක සෙනෙහස සහ ස්මරණය පිළිගන්න. විදෙස් රටවල අය සහ මේ දේශයේ අයට තපස්යාව වෙනුවෙන් ඉතා හොඳ උනන්දුවක් සහ උද්යෝගයක් තිබෙන අතර තපස්යාව ඇති තැන, සේවය ඉබේම සිදු වෙයි. නිරන්තර සාර්ථකත්වය වෙනුවෙන් සුබ පැතුම්. මුළු ලෝකයම ඔබ වෙත බලා සිටින අන්දමේ එවන් නවතාවයක් ඔබ සියලු දෙනාම පෙන්විය යුතුයි. නවතාවයේ ප්‍රදීපාගාරයක් වන්න. අච්චා. ඔබ සෑම කෙනෙක්ම තමන් වෙනුවෙන් සෙනෙහස, ස්මරණය සහ සුබ පැතුම් පිළිගන්න.

**වරදානය:** ඔබගේ පිවිතුරු සිතිවිලි සහ ශ්‍රේෂ්ඨ ඇසුරින් ඔබ සැහැල්ලුවෙන් සිට, අලෞකික සුරදූතයෙක් විලසින් සතුටින් නර්ථනය කරත්වා.

ඔය බ්‍රහ්මිණ් දරුවන්ට දිනපතා මුරලිය පිවිතුරු සිතිවිලිය. ඔබට පියාගෙන් සෑම උදෑසනකම බොහෝ පිවිතුරු සිතිවිලි ලැබෙයි. මෙම පිවිතුරු සිතිවිලි වලින් ඔබගේ බුද්ධිය කාර්යබහුලව තබාගෙන නිරන්තරයෙන් පියාගේ ඇසුරේ හිඳින්න, එවිට ඔබ සැහැල්ලු වී නිරතුරුවම සතුටින් නර්ථනය කරයි. සතුටින් සිටීමේ පහසු මාර්ගය වන්නේ නිරන්තරයෙන් සැහැල්ලුවෙන් සිටීමය. පිවිතුරු සිතිවිලි සැහැල්ලු වන අතර නිෂ්ඵල සිතිවිලි බරයි, එබැවින් නිරන්තරයෙන් පිවිතුරු සිතිවිලි වලින් කාර්යබහුලව රැඳී සිට සැහැල්ලු වී නොකඩවා සතුටින් නර්ථනය කරන්න, එවිට ඔබ අලෞකික සුරදූතයෙක් ලෙස හැඳින්වෙයි.

**පාඨය:** පරමාත්ම දෙවියන්ගේ සෙනෙහසේ පෝෂණ ස්වරූපය වන්නේ පහසු යෝගී දිවියකි.

***** ඕම් ශාන්ති *****